# ශ්‍රී ලංකාවේ යුද පීඩිත කාන්තාවෝ: යුද්ධයේ උරුමය සමග කටයුතු කිරීම

2017 ජූලි 27

Headquarters
**International Crisis Group**
Avenue Louise 149 • 1050 Brussels, Belgium
Tel: +32 2 502 90 38 • Fax: +32 2 502 50 38
brussels@crisisgroup.org

# ශ්‍රී ලංකාවේ යුද පීඩිත කාන්තාවෝ: යුද්ධයේ උරුමය සමග කටයුතු කිරීම

## විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ යුද ගැටුමේ අවසානයෙන් වසර අටකට පසුත්, දිවයිනේ උතුරු නැගෙනහිර දෙමළ කාන්තාවෝ යුද සමයේ උල්ලංඝන සම්බන්ධයෙන් තවමත් යුක්තිය සොයා යමින් සිටිති. සත්‍ය කොමිසමක්, ආගිය අතක් නැති පුද්ගලයන් පිලිබඳ විමර්ශනය කොට වන්දි ලබා දීම සඳහා විශේෂ උසාවියක් සහ කාර්යාල ඇතුළුව ආණ්ඩුව විසින් 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයට ලබා දුන් ගාම්භීර ප්‍රතිඥා සාක්ෂාත් වී නොමැත. මේ, යුද පීඩිත සියලු ජන කණ්ඩායම් වල හදිසි ආර්ථික සහ මනෝ-සමාජීය අවශ්‍යතා සපුරා නොතිබියදීය. කෝපයත්, පාවාදීම පිලිබඳ හැඟීමත් විසින් බිහිකොට කොට ඇති කාන්තා නායකත්වයෙන් යුත් අලුත් විරෝධතා රැල්ලක්, ප්‍රජාවන් අතරත්, රාජ්‍යය සහ දෙමළ පුරවැසියන් අතරත්, දැනටමත්  වැහැරී ගොස් තිබෙන සංහිඳියාව සම්බන්ධ අපේක්ෂා නැවත පලුදු කරන මැසිවිල්ලක මූලාශ්‍රය බවට පත්වීමේ අනතුරක් මතුකරයි. රටේ ප්‍රජාවන් සමාදාන කොට තිරසාර සාමයක් ගොඩනැගෙන ආකාරයෙන් අතීතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කටයුතු කිරීමට නම්, ආණ්ඩුව යුද පීඩිත කාන්තාවන්ගේ අවශ්‍යතා සහ අයිතිවාසිකම් ප්‍රමුඛස්ථානයේ ලා සැලකිය යුතුය. එහි ආරම්භය විය යුත්තේ අතුරුදහන්වූවන් සහ හානිපූරණය සඳහා වන කාර්යාල අප්‍රමාදව ස්ථාපිත කිරීමයි.

සන්නද්ධ ගැටුම ඇවිල යද්දී, උතුරු නැගෙනහිර යුද  කලාපයේ දෙමළ කතාකරන කාන්තාවෝ සත්‍යය සහ වගවීම ඉල්ලා බලසම්පන්න හමුදාවකට සහ ඒකාධිපතිවාදී ආණ්ඩුවකට නිර්භය බලපෑම් කළහ. එහිදී, ඥාතීන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම විශේෂිතය. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ කාරණා යුද්ධයෙන් පසුව දේශීය සහ ජාත්‍යන්තර න්‍යාය පත්‍රයට ඇතුල් කිරීමට හේතු සාධක වූයේ ඔවුන්ගේ උද්සෝෂණ ව්‍යාපාරයි. පොරොන්දු වූ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාම වල හරි මැද ඇත්තේ ලිංගික දූෂණ හා ලිංගික ප්‍රචණ්ඩත්වය, පවුලේ සාමාජිකයන්ගේ මරණ, එල්ටීටීඊ ය විසින් කරන ලද බලහත්කාර බඳවා ගැනීම් සහ ඝාතන, සහ නිවාස හා ප්‍රජාවන් විනාශ කිරීම ආදිය පිළිබඳව මේ කාන්තාවන්ගේ අත්දැකීම් ය. යුද්ධයේ උරුමය විශේෂයෙන්ම යුද පීඩිත කාන්තාවන් මත්තේ දිගටම දුක්පීඩා පටවයි: ආගිය අතක් නොමැති නෑදැයන් ගැන තොරතුරු නැතිවීම, තමන්ගේ භූමියෙන් පලවා හැරීම, ආර්ථික අහේනිය, මනෝ ක්ෂතිය, ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ සූරාකෑමට ගොදුරු වීමේ අවදානම සහ ඉන් බොහොමයක්ම පාහේ තීව්‍ර කරන හමුදාකරණය වූ පරිසරය ඊට අයත් වෙයි.

න්‍යාය පත්‍රය තීරණය කරන ක්‍රියාධාරී බව පැවතියේ වුව, සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය හැඩගැස්වීමේ දී කාන්තාවන්ට භූමිකාවක් ලබා දී නැති තරම්ය. ආණ්ඩුවේ පොරොන්දු ඉටු කිරීමට නව ජවයක් ලබා දෙනු ඇතැයි බොහෝ දෙනා අපේක්ෂා කළ, කාන්තාවන් ගෙන් පුළුල් ලෙස අදහස් විමසා ප්‍රව්චාරණ කාර්ය සාධක බලකාය සම්පාදනය කළ වාර්තාව ආණ්ඩුව බොහෝ දුරට නොතකා හැර ඇත. කුඩා ඉඩම් කැබලි මුදා හැරීම හෝ ජනාධිපතිවරයා අතුරුදහන් වූවන් ගේ ඥාතීන් මුණගැසීම වැනි ඉඳහිට පාන ඉඟි, ආණ්ඩුවේ දේශපාලන ප්‍රවේසම්කාරී බව හා හමුදාව පැත්තට ඇලවීම තුල ගිලී යයි. යුද්ධයේ මූලයන්ට පිළියම් යොදා එය නැවත සිදුවීම වැළැක්වීමට සමත් වීමේ විභවයක් සහිත නව ව්‍යවස්ථාව තවමත් පවතින්නේ අවිනිශ්චිත තත්ත්වයකය.

උතුරු හා නැගෙනහිර කාන්තාවන් සමග පවත්වන ලද විස්තීර්ණ සම්මුඛ සාකච්ඡා වලදී ඔවුන් පැහැදිලිව කියා සිටියේ රාජ්‍යය සහ - අඩු ඒකමිතියකින් යුතුව වුවද - එල්ටීටීඊය විසින්, කරන ලද අපරාධ සම්බන්ධයෙන් යුක්තිය අවශ්‍ය බවයි. ඔවුන්ගේ වඩාත් හදිසි ඉල්ලීම වන්නේ ආගිය අතක් නැති ඥාතීන්ට අත්වූ ඉරණම දැනගැනීමයි. එමෙන්ම, තමන් ඉල්ලා සිටින සත්‍යය හා යුක්තිය ඔවුන්ගේ ආර්ථික, සාමාජීය, මනෝවිද්‍යාත්මක සහ ආරක්ෂක අවශ්‍යතා විසඳීම සඳහා වන පළල් ප්‍රවේශයක අංගයක් විය  යුතු බවද මේ කාන්තාවෝ අවධාරණය කරති.

තර්කානුකූලව ගත් කල, යුද්ධයේදීත් ඉන් පසුවත් අන් කවර ජන කණ්ඩායමකටත් වඩා ශ්‍රී ලංකාවේ වැඩිම පීඩාවට පත්ව සිටින්නේ උතුරේත් නැගෙනහිරේත් දෙමළ කතාකරන කාන්තාවයි. ගෘහ මූලිකාවන් සහ ප්‍රධාන ආදායම් උපයන්නියන් වීමට බල කරනු ලැබූ දස දහස් සංඛ්‍යාත යුද වැන්දඹුවන් සහ අතුරුදහන්වුවන්ගේ භාර්යාවන් සාම්ප්‍රදායික ගෘහස්ථ භූමිකා අතහැර දේශපාලන, ආර්ථික සහ සමාජ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීම සඳහා පොදු ජන ක්ෂේත්‍රයට අවතීර්ණ වී සිටිති. ඔවුන් මෙය සිදු කරන්නේ සිංහල හමුදාව දිගටම රැඳී සිටීම නිසා අනාරක්ෂිත වූ, අනම්‍ය සංස්කෘතික හා සමාජ චාරිත්‍ර වලින් නියාමනය වන අතිශය පුරුෂමූලික සන්දර්භයක් තුලය. ලිංගිකත්වය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් සමස්ත යුද්ධය පුරාම පීඩා විඳි ඔවුන් දැනුත් ඊට මුහුණ පා සිටින්නේ සමාජ හා පවුල් ව්‍යුහ බිඳ වැටීම් මධ්‍යයේය. වැඩි දෙනකුගේ  හදිසි සමාජාර්ථික අවශ්‍යතා ඉටුවී නැති අතර, බොහෝදෙනා බෙලහීන කරන ක්ෂතියෙන් පීඩා විඳිති. යුද්ධය නිසා පැන නැඟුනු තමන්ට සුවිශේෂ අභියෝග වලට මුහුණදී සිටින උතුරු නැගෙනහිර හා රටේ අනෙක් පලාත්වල මුස්ලිම් හා සිංහල කාන්තාවන්ද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයට වඩා හොඳින් ඇතුලත් කරගත යුතුය.

පලදායී සංක්‍රාන්තික යුක්තියක් විසින් කාන්තාවන් මුහුණපා සිටින බරපතල ආර්ථික හා ශාරීරික අනාරක්ෂිත බව අඩු කිරීමත් සිදු කළ යුතුය. ජීවිකාව, විශ්‍රාම වැටුප්, ණය සහන හා මනෝ-සමාජීය ආධාර සඳහා වන පුළුල් සහ වඩාත් හොඳින් සම්බන්ධීකරණය වූ වැඩ සටහන් පවත්වාගෙන යාම සඳහා මනාව සැලසුම් කළ හා බලගැන්වූ හානිපූරක කාර්යාලයක් අවශ්‍යය. දේශපාලනික සහ නිලධාරිවාදී විරෝධතා මැඩ පැවැත්වීම සඳහා එම කාර්යාලයට ජනාධිපතිවරයාගේ සහ අගමැති වරයාගේ ප්‍රබල දේශපාලන පිටුබලයක් ලැබිය යුතුය. එමෙන්ම, ප්‍රජා සහ දිස්ත්‍රික් මට්ටමේ කාන්තා කණ්ඩායම් වලට මූල්‍යමය හා දේශපාලන ආධාර ලබාදීම අත්‍යාවශ්‍යය.

අතුරුදහන්වූවන් සඳහා වන කාර්යාලය වහාම ස්ථාපිත කොට උතුරේ හා නැගෙනහිරේ ශාඛා පිහිටුවීමට ප්‍රමාණවත් සම්පත් ලබා දිය යුතුය. යුද පීඩිත කාන්තාවන්ද ඇතුළු විශ්වසනීය, ස්වාධීන හඬ වලින් එහි කාර්ය මණ්ඩලය සමන්විත විය යුතුය. ජාත්‍යන්තර සම්බන්ධතාවයකින් යුතු වගවීම් කාර්යාවලියක් ඉක්මනින් එනු නැති වුවත්, ශ්‍රී ලංකාවට තමන්ගේ අනේකවිධ අවතාර නින්දට යවා අනාගත ගැටුම් සඳහා ඇති ඉඩ ප්‍රස්තා සමනය වීම සහතික කිරීමේදී එය තීරණාත්මක වෙයි.

ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය පණ අදිමින් සිටීමට බොහෝ දුරට හේතුවී ඇත්තේ එම ක්‍රියාදාමයට මහජන සහාය ලබාගැනීමට හෝ එමගින් සියලු ප්‍රජාවන්ට වාසි සැලසෙන බව සන්නිවේදනය කිරීමට හෝ ආණ්ඩුව කවරදාකවත් උත්සාහ නොකිරීම නිසාය. හානිපූරක සහ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ කාර්යාල යුද්ධයේ උරුමයන් වලට ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන මහා පරිමාණ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීමෙන් දේශපාලන විරුද්ධවාදීන්ගෙන් සහ යුද හමුදාවෙන් මතුවන විරෝධතාව බලරහිත කිරීමට උපකාරී වනු ඇත.

යුද පීඩිත කාන්තාවන්ගේ නිශ්චිත අවශ්‍යතා වලට යොමුවී, ඔවුන් සංක්‍රාන්තික යුක්ති වැඩ සටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් පූර්ණ වශයෙන් යොදා ගැනීම උතුරු නැගෙනහිර නැග එන ආතතිකාරී තත්වය අඩු කොට, 2015 පොරොන්දු වූ දේශපාලන සංක්‍රාන්තිය තවමත් සැබෑ කර ගත හැකිය යන බලාපොරොත්තුව ප්‍රකෘතිමත් කිරීම සඳහා තැබිය යුතු අත්‍යාවශ්‍ය පියවර වෙයි.

## *නිර්දේශ*

*අංග සම්පූර්ණ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ දී දුන් පොරොන්දු ඉටුකිරීමට මුල පුරනු පිණිස:*

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට:**

1. හානිපූරක සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ කාර්යාල වලින් සියලු ප්‍රජාවන්ට හිමිවන පල ප්‍රයෝජන පිළිබඳව පැහැදිළි කොට දේශපාලන විරුද්ධවාදීන්ගෙන් සහ යුද හමුදාවෙන් නැග එන විරෝධය අඩුකිරීම පිණිස දැවැන්ත මහජන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම.
2. ස්වාධීන කාර්ය මණ්ඩලයක්, උතුරේත් නැගෙනහිරත් කාර්යාල සහ වින්දිතයන්ගේ ඥාතීන්ට භූමිකාවක් සහිතව අතුරුදහන් වූවන් සඳහා වන කාර්යාලය වහාම ක්‍රියාත්මක කිරීම.
3. හානිපූරණ නීතිය කෙටුම්පත් කිරීම සඳහා මහජන අදහස් කැඳවීම මගින් හානිපූරක කාර්යාලයක් පිහිටුවීමේ ක්‍රියාදාමය ආරම්භ කිරීම. සිංහල, මුස්ලිම් සහ දෙමළ සහාය ලබන වරමක් සහ කාර්යාලයක් සැලසුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් මහජන මතය හා සමග ප්‍රචාරණ කාර්ය සාධක බලකායේ වාර්තාවේ අදාළ නිරීක්ෂණ ද සැලකිල්ලට ගත යුතුය.
4. සියලුම ප්‍රජාවන්ට අයත් යුද පීඩිතයන් සහ ඔවුන්ගේ ඥාතීන් ට වාසි සැලසෙන වැඩ සටහන් සම්බන්ධීකරණය කළ හැකි පරිදි හානිපූරක කාර්යාලය සැලසුම් කොට බල ගැන්වීම.
5. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආධාර ලබා දෙන්නන් සහ පළාත් සභා සමග එක්වී, විශේෂයෙන්ම ගෘහ මූලික කාන්තාවන් මුල්කොටගත් යුද පීඩිත කාන්තාවන්ගේ ආර්ථික අවශ්‍යතා විධිමත් ලෙස තක්සේරු කොට, වින්දිතයන්ගේ පවුල් වෙනුවෙන් සාධාරණ සහ තේරුම් ගැනීමට පහසු විශ්‍රාම වැටුප් ක්‍රමයක්, යුද පීඩිත දරුවන් ගේ අධ්‍යාපනය වෙනුවෙන් මුදල්, වැය දැරිය හැකි නිවාස සහ වැන්දඹුවන්ගේ ඉඩම් අයිතිය හෝ කුලීකරය තහවුරු වන ප්‍රතිසංස්කරණ ඇතුලත් වැඩ සටහන් සැලසුම් කිරීම.
6. යුද පීඩිත කලාපයේ සියලු දෙනාටම ලබාදෙන මනෝ-සමාජීය ආධාර වැඩිදියුණු කොට එය අනාගත ප්‍රචාරණ සහ යාන්ත්‍රණ සමග ඒකාබද්ධ කර, ලිංගිකත්වය පදනම් කොටගෙන, හිංසනයට, විශේෂයෙන්ම ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරුවූ පීඩිතයන්ට අංග සම්පූර්ණ වෛද්‍ය පහසුකම් සලසා දීම.

7. යුද හමුදාවට 2009 දී භාරවූ සියලුම දෙනාගේ නම් ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කර, දණ්ඩ මුක්තිය නිමා කොට වගවීම් සම්බන්ධ විශේෂ අධිකරණයක් පිහිටුවීම සඳහා දේශපාලන සහාය දිනා ගැනීම දිසාවට තබන පියවරක් ලෙස, අතුරුදහන් වීම්, පැහැරගැනීම් සහ යුද සමයේත්, ඉන් පසුවත් කරන ලද සංකේතාත්මක වශයෙන් වැදගත් කමක් උසුලන අපරාධ සම්බන්ධයෙන් විශ්වසනීය සහ ස්වාධීන පොලිස් පරීක්ෂණ පැවැත්වීම.

8. හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ගේ පවුල්වල සාමාජිකයන්ද ඇතුළු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ඇති මළවුන් සැමරීමේ අයිතිය පිළිගැනීම.

*යුද පීඩිත කාන්තාවන්ට සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ සමග පලදායී ලෙස සම්බන්ධ වීම පහසුකරවන පරිසරයක් ඇති කිරීම සඳහා:*

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට:**

9. අතුරුදහන් වූවන්ගේ සහ හානිපූරක කාර්යාල සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී කාන්තාවන්, ජීවිත බේරා ගත්තවුන් සහ කලාපීය කාර්ය සාධක බලකා සාමාජිකයන් ගේ අඛණ්ඩ සහභාගිත්වය සහතික කිරීම.

10. උතුරේත්, නැගෙනහිරත් කාන්තාවන්ට එරෙහි ලිංගික සූරාකෑම සහ හිංසනය වැලැක්වීම සඳහා යට දැක්වෙන ඒවාද ඇතුලත් පියවර ගැනීම: හමුදාවේ සහ රජයේ නිලධාරීන් සඳහා චර්යා ධර්ම පද්ධති බලාත්මක කිරීම, ලිංග භේදය පදනම් කොටගත් ප්‍රචණ්ඩතා වලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ පුහුණුවක් ලත් කාන්තාවන් හා දෙමළ කතාකරන පොලිස් නිලධාරීන් වැඩියෙන් යෙදවීම, පොලිසියේ සහ රජයේ කාර්යාලවල කාන්තා හා ළමා කාර්යාංශ මෙන්ම ලිංගික සහ ලිංග භේදය පදනම් කරගත් හිංසනය සම්බන්ධ නඩු විභාග කිරීමට විශේෂ මහාධිකරණයක් පිහිටුවීම.

11. හමුදාව විසින් හිටි හැටියේ නිවාස වලට ඇතුල් වීම ඇතුළුව කාන්තාවන්ගේ නිවාස සෝදිසි කිරීම් නවතා දැමීම මගින් උතුරු හා නැගෙනහිර ජනජීවිතය කෙරේ හමුදාවේ බලපෑම අඩු කිරීම; හමුදාව විසින් අල්ලාගෙන සිටින පුද්ගලික ඉඩම් ආපසු දීම වේගවත් කිරීම සහ හමුදා කඳවුරු හා මුරකපොලු සංඛ්‍යාව අඩු කිරීම.

**එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ ජාත්‍යන්තර ආධාර දෙන්නන්ට:**

12. උතුරු නැගෙනහිර ජීවනාධාර වැඩසටහන් වල දැනට පවතින අසාර්ථකතා අනුපාතිකය සහ ඉහල ණය ප්‍රමාණය අඩු කිරීම සඳහා පිළිවෙත් සහ සාමූහික අධීක්ෂණ ක්‍රියාමාර්ග සකස් කරගැනීම.

13. කලාපීය කාර්ය සාධක බලකායේ සාමාජිකාවන් ඇතුළු ප්‍රජා සහ දිස්ත්‍රික් මට්ටමේ කණ්ඩායම් සඳහා ලබාදෙන දේශපාලන සහ ආර්ථික ආධාර වැඩි දියුණු කිරීම.

14. වෙනස්වන සහ එන්න එන්නම දුෂ්කර අතට හැරෙන දේශපාලන සන්දර්භයට සහ ආණ්ඩුව විසින් දියත් කරන්නට ඉඩ තිබෙන කවර හෝ අලුත් මුල පිරීමකට වඩාත් හොඳින් ප්‍රතිචාර දැක්විය හැකි වන පරිදි එක්සත් ජාතීන්ගේ සාම සාධක ප්‍රමුඛතා සැලැස්ම පුනරීක්ෂණය කිරීම.

INTERNATIONAL
CRISIS
GROUP